*සැ. යු.*- 2018.02.02 දින පළ වූ අංක 2,057 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,058 - 2018 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා - 2018.02.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 240 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත 2018 ජනවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මාර්තු මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 පෙබරවාරි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

239- B 81251 — 5,403 (2018/02)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III වැනි ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාත තුළ ස්ථිර පදිංචි, සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018 අප්‍රේල් මස කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

02. *වැටුප් ක්‍රමය*.- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ආදායම් පරීක්ෂක තනතුරෙහි III, II හා I වැනි ශ්‍රේණිවලට අදාල මාසික වැටුප් පරිමාණය (MN-1/2016) - රු. 27,140, - 10 x 300- 11 x 350 - 10 x 495- 10 x 660 = 45,540 ක් වන අතර, එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිට වේ.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

3.1 *අධ්‍යාපන සුදුසුකම් :-*

සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි හා තවත් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වීම, (මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතු ය) ; සහ

අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම, පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03 ක් සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

3.2 *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්න අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ඡන්ද හිමි නාම ලේඛනය අනුව ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

(iv) සෑම අයදුම්කරුවෙක් ම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් හා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(v) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 කට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු වුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

04. *සේවා කොන්දේසි :*

4.1 මෙම තනතුර ස්ථිරය. තනතුරට අදාල විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් අදාළ වන පරිදි අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

4.3 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ/උසස් කිරීමේ පටිපාටියේ රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝග

වලට ද, වයඹ පළාත් විනය කාර්යය සංග්‍රහයට ද, පළාත් මූල්‍ය රීති සංග්‍රහයට ද, වයඹ පළාත් ආදායම් පරීක්ෂක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ද, රජය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරින් බැඳී සිටිය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.*- මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල අනුව බඳවා ගැනේ. පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂය සඳහා වෙන්කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති ලකුණු ගණනින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා බඳවාගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පවතින පුරප්පාඩු ගණනට සමාන පිරිසක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. *විභාග පරිපාටිය.*- අපේක්ෂකයාගේ රාජකාරි කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස සකස් කරනු ලබන විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි. (ලකුණු 100 යි)

(අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.)

(ii) භාෂා හැකියාව - කාලය පැය 01 යි (ලකුණු 100 යි)

(අපේක්ෂකයා සතු අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

07. *විභාග ගාස්තු.*- විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් **වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට** බැර වන පරිදි තම ස්ථිර පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස. මු. 02 ආකෘතියෙන් ලබා ගත් රිසිට්පත තම අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. මෙම රිසිට්පත හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත්, මුදල් ඇණවුම් හෝ මුද්දර ගාස්තු හෝ බාර ගනු නොලැබේ. ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු නොගෙවන බවත්, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිය යුතු ය.

08. ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-

8.1 මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය අංක 01 සිට 03 තෙක් කරුණු පළමුවන පිටුවට ද, 04 සිට ඉදිරියට ඇති කරුණු දෙවන හා තුන්වන පිටුවලට ද, ඇතුලත් වන ලෙස සකස් කළ යුතු අතර අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාග යේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද, යෙදීමට අවශ්‍ය වේ. සම්පූර්ණ කරන ලද අයැදුම්පත් **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ආදායම් පරීක්ෂක සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2018"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

8.2 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයැදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

8.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිසි ලෙස තොරතුරු ඇතුළත් නොකළ, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන, අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.4 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :-

අයදුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි.

9. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2018.03.09 වේ.**

10. මෙම නිවේදනයේ දක්වා සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදල ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාල සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය*.- අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන*.- විභාග ශාලාවේදී තම අනන්‍යතාව තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

12. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කාලසටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලයීය වෙබ් අඩවියේ (www.psc.nw. gov.lk) නිවේදනයක් මඟින් පළකරනු ඇත. විභාග නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබිණි. නම් ඒ බව වහාම "**ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල**" යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(i) අයැදුම්කරුගේ සම්පූර්ණ නම :.....................................................
(ii) විභාගයේ නම :.................................................................................
(iii) සම්පූර්ණ ලිපිනය :..........................................................................
(iv) ජාතික හැඳුනුම්පත් අංකය :...........................................................
(v) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය හා ලියාපදිංචි කළ විස්තර :..............................................................

13. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑ කමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

14. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොපිළිගැනීමක් හෝ අනනුකුලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

16. මෙම විභාග පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජනවාරි මස 24 වැනි දින,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම් වල සඳහන් කරුණු සහ අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

Open Competitive Examination for Recruitment to Grade III of Revenue Inspector Service of Provincial Department of Local Government (N. W. P.) 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ( අදාල කොටුවේ "✓" ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................

.......................................................................... මයා/මිය/මෙනෙවිය

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- Mr./Ms.//Mrs. :..........................................................................

..........................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................

.......................................................................... මයා/මිය/මෙනෙවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Mr./Ms//Mrs. :..........................................................................

..........................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................

..........................................................................

2.2 වර්තමාන ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................................................

.....................................................................................................................................................................

2.3 දුරකථන අංකය : පෞද්ගලික :...................................... රාජකාරී :..............................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල කොටුව තුල x ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. උපන් දිනය : වර්ෂය :........................, මාසය :........................, දිනය :........................

05. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.03.09 දිනට වයස :

අවුරුදු :....................., මාස :......................, දින :.........................

06. 2018.03.09 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :

අවුරුදු :....................., මාස :........................, දින :.........................

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3.1 හි සඳහන් පරිදි)

අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

| | *සමත්වූ වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|
| පළමුවර | | |
| දෙවන වර | | |

අ.පො.ස. (සා. පෙ.) ලබා ඇති ප්‍රතිඵල :

| | *විෂයය* | *පළමුවර සාමාර්ථය* | *දෙවන වර සාමාර්ථය* |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය ඃ

වර්ෂය ඃ.................................. විභාග අංකය ඃ..................................

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය ඃ.........................................................................................
දිනය ඃ.........................................................................................
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඃ......................................................................

ලදුපත මෙම කොටුව තුල නොගැලවෙනසේ අලවන්න

09. අයැදුම්කරුගේ සහතිකය ඃ

....................................................................වන මා විසින් මෙම අයැදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක.................... හා .......................................වැනි දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ......................................

**අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන...................................................... මයා./මිය./මෙනෙවිය, මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය .............................. දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම ඃ...............................................................................................
අත්සන ඃ...............................................................................................
තනතුර හා නිල මුද්‍රාව ඃ...............................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

(අනවශ්‍ය වචන කපා හරින්න.)

...........................................................................මයා./මිය./මෙනෙවිය දැනට........................................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ..........................................................................................වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

.......................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :......................................

02-360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.